ගොවිකම් මාවත.—1/3, 3/1, 3/6, 3/7, 3/8, 7, 7/1, 9, 13/1, 13/2, 15/9, 23/2, 23/3, 27, 27/5, 31, 35, 37/3, 43/2, 43/3, 49, 49/1, 49/2.

**1973 සැප්තැම්බර් 20 වැනි බ්‍රහස්පතින්දා :**

ගොවිකම් මාවත.—55, 67, 69/4, 69/5.
හරමානිස් පටු මග.—5, 7, 17, 19, 19/1, 19/2, 21, 12/1.
හරමානිස් පටු මගින් ඔබ්බෙහි පටු මග.—7/1.
ඉද්දමල් මාවත.—1, 9, 13, 2.
ජය මාවත.—1, 19ඒ, 8, 10, 20, 35, 37, 39, 41.

**1973 සැප්තැම්බර් 21 වැනි සිකුරාදා :**

ජය මාවතෙන් ඔබ්බෙහි 1 වැනි පටු මග : 6, 12.
ජය මාවතෙන් ඔබ්බෙහි 2 වැනි පටු මග.—5, 7, 13, 6, 6ඒ, 12, 16.
ජය මාවත : 19/3, 29, 31, 31/3.

**1973 සැප්තැම්බර් 24 වැනි සඳුදා :**

ජය මාවතෙන් ඔබ්බෙහි 5 වැනි පටු මග.—3, 11, 21, 2, 6, 8, 16.

ජය මාවතෙන් ඔබ්බෙහි 1 වැනි හරස් පටු මග.—8/7, 8/8, 8/9, 8/11, 8/12, 8/14, 8/15, 10, 12, 12/1, 12/2.

**1973 සැප්තැම්බර් 25 වැනි අඟහරුවාදා :**

කටුකුරුඳුවත්ත පාර.—7, 7/1, 21, 23, 16/1, 22/1, 24, 24/1, 24/2, 26, 28, 30, 32/2, 36, 36ඒ, 40,46/6, 46/8, 52/1, 52/3, 52/4ඒ, 58, 58/1, 58/1.

**1973 සැප්තැම්බර් 27 වැනි බ්‍රහස්පතින්දා :**

කටුකුරුඳුවත්ත පාරෙන් ඔබ්බෙහි 1 වැනි පටු මග.—7, 13, 15, 12, 18.
කටුකුරුඳුවත්ත පාරෙන් ඔබ්බෙහි 2 වැනි පටුමග.—6, 12.
කවුඩාන–අත්තිඩිය පාර.—79, 85/4, 85/7, 87, 91/1, 97, 97/1, 97/2, 99, 103, 111, 111/1, 74, 80/4, 96/4.

**1973 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා :**

ශ්‍රී ධර්මාධාර මාවත.—57/4, 77, 83/3, 83/6, 83/7, 48, 54, 56, 64, 70, 56බී, 72/1, 76, 82, 94.
මල්ලිකා මාවත.—4, 6, 8, 10, 18, 20.
මල්ලිකාරාම පාර —15, 17, 45, 12, 20, 26, 32, 44, 46, 54, 64.

**1973 ඔක්තෝබර් 1 වැනි සඳුදා :**

මන්ත්‍රිමුල්ල පාර.—1, 3, 5, 7, 9, 39, 18, 20/3, 22, 26, 26/1, 26ඒ, 28, 30, 34, 34/1, 34/6, 34/10, 44, 46/2, 48, 50/4, 50/5, 50/6, 50/9, 54.

**1973 ඔක්තෝබර් 2 වැනි අඟහරුවාදා :**

මන්ත්‍රිමුල්ල පාරෙන් ඔබ්බෙහි පටුමග.—1, 5, 7, 13, 17, 4, 8, 10, 14/1, 16, 20.
අළුත් ගුවන් තොටුපල පාර.—130.
පන්සල පාර.—5, 15, 21, 35, 37, 14.

**1973 ඔක්තෝබර් 3 වැනි බදාදා :**

පැරකුම් මාවත.—33/9, 5, 5/2, 5/5, 17/1, 33/14,33/15, 45/3, 45/4, 45/6, 45/10, 45/11, 45/12, 49, 53/2, 10/6, 10/8, 10/10, 10/14, 12, 28/3, 30.

**1973 ඔක්තෝබර් 4 වැනි බ්‍රහස්පතින්ද :**

පොකුණ පාර.—1, 5/3, 5/6, 5/8, 5/14ඒ, 7, 15, 21, 25, 4, 6, 12, 16, 22, 28/5, 28/9, 28/10, 34.
පෝස්ට්මාස්ටර්ස් ප්ලේස්.—7, 6, 12.
රත්මලාන පාරෙන් ඔබ්බෙහි 2 වැනි පටුමග.—49.

**1973 ඔක්තෝබර් 5 වැනි සිකුරාදා :**

සමගි මාවත.—1, 3, 3/1, 3/2, 5, 7, 9, 13, 17/1, 17/2, 21, 25, 29, 31/2, 31/4, 33, 4, 14, 14/1, 18, 20, 20/1, 30, 34.

**1973 ඔක්තෝබර් 8 වැනි සඳුදා :**

ශ්‍රී ඥානරතන මාවත.—33, 14 එෆ්, 30.

ශ්‍රී ඥානරතන මාවතෙන් ඔබ්බෙහි 1 වැනි පටු මග.—3, 7, 2/1.
ශ්‍රී ඥානරතන මාවතෙන් ඔබ්බෙහි 2 වැනි පටු මග.—5, 7.
ටෙම්ප්ලස් පාර.—157, 169, 217/3, 217/5, 217/7, 217/13ඒ, 225, 104/2ඩී, 112, 120, 148.

**1973 ඔක්තෝබර් 9 වැනි අඟහරුවාදා :**

ටෙම්ප්ලස් පාරෙන් ඔබ්බෙහි 1 වැනි පටු මග.—6, 16, 20.
ටෙම්ප්ලස් පාරෙන් ඔබ්බෙහි 2 වැනි පටු මග.—7/11, 7/14, 7/12, 7/15, 9, 11, 11/1, 11/3, 11/4, 11/5, 11/6, 8.
රත්මලානෙන් ඔබ්බෙහි 12 වැනි පටු මග.—54, 54/1, 56, 60, 64, 66, 76, 82, 86, 88, 90.

**1973 ඔක්තෝබර් 10 වැනි බදාදා :**

12 වැනි පටු මගින් ඔබ්බෙහි 1 වැනි පටු මග.—7, 19, 19/1, 25, 6, 6/1, 16, 22, 28, 30, 32, 34.
උදය මාවත.—3, 7, 6, 20.
උපනන්ද මාවත.—3, 5, 17, 21/2, 23, 27/2, 27/3, 27/6, 27/8, 29, 31, 10, 12, 14, 18, 20, 28.

8-524—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## නාවලපිටිය නගරය—දේපල විකිණීම

හිඟ වරිපනම් බදු සඳහා තහනමට ගන්නා ලද චංචල දේපල විකිණීම

පහත සඳහන් දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් බදු ගෙවා නැති බැවින්, 1971 අංක 48 දරණ පළාත් පාලන බලමණ්ඩල (විශේෂ විධිවිධාන) පනතේ සංශෝධනය කරන ලද 255 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 170 වගන්තියෙන් කියවෙන පරිදි 252 වැනි අධිකාරය වන මහ නගර සභා ආඥාපනතේ 252 වැනි වගන්තිය අනුව නාවලපිටිය නගරයේ ලේකම්වරයා විසින් නිකුත් කරන ලද වරෙන්තුවක බලය පිට යථෝක්ත ස්ථාන යන්හි තිබී තහනම් කරන ලද පහත සඳහන් උපලේඛනයේ දක්වෙන චංචල දේපල මෙම සභාවට ලැබිය යුතු හිඟ මුදල් සහ වියදම් යථා කාලයේදී ගෙවනු නොලැබුවහොත්, නාවලපිටිය විශේෂ කොමසාරිස් කාර්යාලය අසලදී 1973 අගෝස්තු මස 10 වෙනි දින පෙරවරු 10ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බැව් මෙයින් දන්වා සිටිනු ලැබේ.

මංජල් කු. ලියනගේ,
ලේකම්,
නාවලපිටිය නගරය.

1973 ජූලි මස 24 දින,
නාවලපිටිය,
විශේෂ කොමසාරිස් කාර්යාලයේදීය.

### උපලේඛනය

| ස්ථානය | තහනමට ගත් බඩු |
| --- | --- |
| කොට්ඨාශ අංක 1, කරගඳුන්ගල පාර, 11. | උෂා වර්ගයේ මහන මැෂින් 1 යි. |

8-523—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

# විවිධ දැන්වීම්

## නුවරඑළිය මහ නගර සභාව

1973 වර්ෂය සඳහා වරිපනම් පොත්

1973 වර්ෂය වෙනුවෙන් පිළියෙල කර ඇති වරිපනම් පොත් නගර සභා කාර්යාලයේ තබා ඇති බව (252 අධිකාරය) මහ නගර කාර්යාල වේලාවේදී මහජනයාගේ පරීක්ෂණය සඳහා මෙම මහ සභා ආඥාපනතේ 235 (1) ඡේදය අනුව මෙයින් දැනුම් දෙමි.

ඩී. ඩබ්ලිව්. සමරතුංග,
නුවරඑළිය නාගරික කොමසාරිස්.

1973 ජූලි මස 25 වෙනි දින,
නුවරඑළිය මහ නගර සභා කාර්යාලයේදීය.

8-411—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## කෑගල්ල නගර සභාව

විදුලිබල පනතේ 36 වැනි ඡේදය යටතේ විදුලිබල ගාස්තු ප්‍රතිශෝධනය කිරීම

යථොක්ත කාරණය සම්බන්ධයෙන් 1973 මැයි 25 දාතමින් යුතුව, 1973. 06. 08 දින අංක 63 දරණ ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ IV වෙනි කොටසේ ප්‍රසිද්ධියට පමුණුවන ලද, ගාස්තු චක්‍රයේ ගාස්තු අංක 2 (ගාමක බලය සඳහා හෝ විද්‍යුත් රසායනික නැතහොත් විද්‍යුත් තාප ක්‍රියා සඳහා) 2 වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කර නිවැරදි කරනු ලැබේ:—

"2. අඩුම අය කිරීම මසකට රුපියල් 6 බැගින් (මනු කුළිය හැර) නැතහොත්, නිර්නිත අවශ්‍යතාවයේ කි.වෝ.ඇ. එකක් හෝ ඉන් කොටසක් හෝ සඳහා රුපියල් 1 බැගින් යන දෙකින් වැඩි ගණන".

පූ. බ. බාලසූරිය,
සභාපති,
කෑගල්ල නගර සභාව.

1973 ජූලි 28 දින,
කෑගල්ල නගර සභා කාර්යාලයේ දී ය.

8-479—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## බදුල්ල නාගරිකය

විනෝද බදු ආඥාපනත (267 වැනි අධිකාරය)

විනෝද බදු ආඥාපනතේ 9 (2) වැනි වගන්තිය යටතේ වූ 1973.07.31 දින අංක 139 දරණ පහත සඳහන් තීරණය එකී ආඥා පනතේ 9 (6) වැනි වගන්තිය යටතේ ප්‍රකාශයට පත් කරමි.

### තීරණය

ලංකා රගර් පාපන්දු ක්‍රීඩා සංගමයේ මෙහෙයවීමෙන් 1973 අගෝස්තු මස 4 වෙනි දින බදුලු ක්‍රීඩාංගනයේ දී පැවැත්වීමට නියමිත රගර් පාපන්දු ක්‍රීඩා තරඟය, විනෝද බදු ආඥාපනතේ (267 වෙනි අධිකාරය) 9 (2) වගන්තිය ප්‍රකාර, විනෝද බද්දෙන් නිදහස් කිරීම අනුමත කරමි.

එච්. එම්. අබේපාල,
විශේෂ කොමසාරිස් බදුල්ල නාගරිකය.

විශේෂ කොමසාරිස් කාර්යාලය,
බදුල්ල, 1973 ජූලි 31.

8-575—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ බලපිටිය සුළු නගර සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ:—

### යෝජනාව

පළාත් පාලන ඇමතිවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරනලද යෝජනාවකින් අනුමත කරනලද බව, 1954 මාර්තු මස 26 වැනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල I සිට XXIX දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට බලපිටිය සුළු නගර සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරය) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

පී. වයිමන් ද සිල්වා,
සභාපති,
බලපිටිය සුළු නගර සභාව.

1972 නොවැම්බර් මස 27 වන දින,
බලපිටිය සුළු නගර සභා කාර්යාලයේ දිය.

8-399—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනත

පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි අධිකාරිය) 3 වන වගන්තිය යටතේ මහරගම සුළු නගර සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළකර සිටිනු ලැබේ:—

### යෝජනාව

පළාත් පාලන කටයුතු පිළිබඳ ඇමතිවරයා විසින් සම්පාදනය කරන ලද්දාවූද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවකින් අනුමත කරන ලද බව 1954 මාර්තු 26 වැනි දින අංක 10,657 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයකින් ප්‍රකාශ කරන ලද්දාවූද, 1953 නොවැම්බර් 6 වැනි දින අංක 10,609 දරණ ගැසට් පත්‍රයේ පළවී ඇති පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල I සිට XXVIII දක්වා වූ කාණ්ඩ මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළවන දින සිට සම්මත කර ගැනීමට මහරගම සුළු නගර සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වන අධිකාරිය) 3 වැනි වගන්තියේ (1) වන උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

ඊ. ඩී. චන්ද්‍රසේකර,
සභාපති,
මහරගම සුළු නගර සභාව.

1973 ජූලි මස 25 දින,
මහරගම,
සුළු නගර සභා කාර්යාලයේ දීය.

8-364—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## රුවන්වැල්ල සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

රුවන්වැල්ල සුළු නගර සභා ප්‍රදේශය තුළ ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නාවූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්ද වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ කිසියම් සුනඛයෙකු (බල්ලෙකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවෙලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනයේ සඳහන් දින සිට හය මාසයක කාලයක් මෙය බලපවත්වනු ඇත.

ඩී. එම්. හේමපාල දිසානායක,<br>
සභාපති,<br>
රුවන්වැල්ල සුළු නගර සභාව.

1973 ක්වූ ජූලි මස 25 වෙනි දින,<br>
රුවන්වැල්ල සුළු නගර සභා කාර්යාලයේ දී ය.

8—359—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## අගලවත්ත සුළු නගර සභාව

### ජල භීතිකා රෝගය

අගලවත්ත සුළු නගර සභා සීමාව තුල ජලභීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුල පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක, ගෙමිදුලක හෝ ගෙවත්තක නොවන්නා වූ, අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නාවූ, කිසියම් සුනඛයෙකු (බල්ලකු හෝ බැල්ලියකු) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයෙකු විසින් එවේලේම විනාශ කරනු ලබන බව (ලංකාවේ ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වන පරිච්ඡේදය වන) ජලභීතිකා ආඥාපනතේ 11 වැනි වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශනය කරනු ලැබේ.

මෙම ප්‍රකාශනය 1973 ජූලි මස 1 වැනි දින සිට 1973 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වලංගුව පවතී.

ඒ. ඩී. මර්වින් සමරනායක,<br>
සභාපති,<br>
අගලවත්ත සුළු නගර සභාව.

1973.07.01 දින,<br>
අගලවත්ත සුළු නගර සභා කාර්යාලයේදීය.

8-525—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ගලගිවියාව ගම්සභාව

### යෝජනා අංක 5—1973.07.28.

"අංක 14,932/1970.11.12 දින දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පලකරන ලද දැන්වීමක් මගින්, කොළඹ දිස්ත්‍රික්කයේ ගලගිවියාව ගම්සභාවේ දියුණු ගම්මණ්ඩී ප්‍රකාශයට පත් කිරීම පිළිබඳ නිවේදනයේ, අකරවිට දියුණු ප්‍රදේශය යටතේ සඳහන් විස්තර වල "දෙපසට අඩි 300 ක බිම් තීරුද" යන වැකිය ළඟට ඒ එක්කම "අකුරවිට පහලගම පිරිවෙන පාරේ (ධම්මරතන මාවත) ගම්පහ නගර සභා සීමාවේ සිට (අලුවකැල්ලේ බෝක්කුව මායිම් කොට) පහලගම විතානගේ හේමපාල මහතාගේ ඉඩමේ කෙළවර දක්වාද, ගම්පහ-ජාඇල ප්‍රසිද්ධ පාරේ, අකරවිට සිරිපාල සමරකෝන් මහතාගේ ඉඩමේ බටහිර මායිමේ සිට ගම්පහ නගර සභා සීමාව තෙක්ද, පාරේ මැද සිට දෙපසට අඩි 300 ක් බැගින්වූ බිම් තීරුද" යන කොටස යෙදීමෙන්, ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 37 (අ) වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ඇතිව සංශෝධනය කර ඇති බැව් මහජනයාගේ දැනගැනීම පිණිස මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ."

එච්. ඩී. ගිල්බට්,<br>
සභාපති,<br>
ගලගිවියාව ගම්සභාව.

1973.07.31 දින,<br>
ගලගිවියාව ගම්සභා කාර්යාලයෙහිදීය,<br>
ගණේමුල්ල.

8-516—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## කටාන ගම් සභාව

### ගෝඝාතක ආඥා පනත

මෙහි පහත උපලේඛණයේ නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි මස් වෙළෙඳාම් කිරීමෙන් ගෝඝාතක ව්‍යාපාරය පවත්වාගෙන යෑම සඳහා 1973 වර්ෂයට බලපත්‍ර ඉල්වා අයදුම් පත් මා වෙත ඉදිරිපත් කර තිබෙන බව ගෝඝාතක ආඥා පනතේ (272 වැනි අධිකාරය) 7 (2) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

එකී බලපත්‍ර නිකුත් කිරීම ගැන කටාන ගම් සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම්, ඔහු හෝ ඇය එසේ විරුද්ධවන්නේ කුමන හේතුවක් නිසා ද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත එවිය යුතු බව මෙයින් දැනුම් දෙමි.

ඩී. ජේ. ප්‍රනාන්දු පුල්ලේ,<br>
සභාපති,<br>
කටාන ගම් සභාව.

1973.07.30 වැනි දින,<br>
කටාන ගම්සභා කාර්යාලයේ දීය.

### උපලේඛණය

| අයදුම්කරුගේ නම සහ ලිපිනය | ස්ථානය | ව්‍යාපාරයේ නම |
|---|---|---|
| ටී. වික්ටර් පෙරේරා, කඳවල, කටාන ... | ඇත්ගාල පිහිටි, ඇත්ගාල අංක 1 දරණ ගම්සභාව සතු කඩපිල | හරක්මස්, එළුමස් සහ ඌරු මස් විකිණීම |

8-543—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## වැලිගම නගර සභාව

### ජල භීතිකා රෝගය

වැලිගම නගර සභා සීමාව තුළ ජල භීතිකා රෝග උවදුර පවතින බැවින් එම නගර සීමාව තුළ පිහිටි පෞද්ගලික ගොඩනැගිල්ලක හෝ ගෙමිදුලක හෝ ගෙවත්තක හෝ නොවන්නා වූ අන්‍ය ප්‍රසිද්ධ ස්ථානයක හෝ පාරක හෝ හමුවන දඬාවතේ යන නැතහොත් බැඳ නොතබන ලද්දා වූ හෝ දක්කාගෙන නොයනු ලබන්නා වූ කිසියම් සුනඛයකු (බල්ලකු හෝ බැල්ලියක හෝ) මා විසින් ලියවිල්ලකින් බලය පවරනු ලබන අයකු විසින් එවේලෙහිම විනාශ කරනු ලබන බව (ලංකා ව්‍යවස්ථාපිත ප්‍රඥප්ති සංග්‍රහයේ 476 වැනි පරිච්ඡේදය වන) ජල භීතිකා ආඥා පනතේ දෙවන වගන්තියේ ප්‍රකාර මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

මෙම ප්‍රකාශය 1973 ජූලි මස 26 වන දින සිට හය මාසයක් වලංගු වන්නේ ය.

ම. අ. ලීලාරත්න,<br>
සභාපති,<br>
වැලිගම නගර සභාව.

1973 ජූලි 26 දින,<br>
වැලිගම නගර සභා කාර්යාලයේ දීය.

8-573—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## බෙලිඅත්ත නගරය

### 1974 වර්ෂයේ සුනඛයින් ලියා පදිංචි කිරීමේ ගාස්තු

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි අධිකාරියේ) 4 වගන්තිය ප්‍රකාර බෙලිඅත්ත සුළු නගර සභා සීමාව තුළ තබාගෙන සිටින සෑම පිරිමි සුනඛයෙක් සඳහා රු. 1 ක් ද සෑම ගැහැණු සුනඛයෙක් සඳහා රු. 1ක් බැගින් ද 1974 මාර්තු මස 31 වෙනි දාට පෙර හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් 1974 වර්ෂයට පනවා ඇති බව බෙලිඅත්ත නගරය පාලනය කරන විශේෂ කොමසාරිස් නාමා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්,
බෙලිඅත්ත නගරය.

1973.07.31 දින,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
බෙලිඅත්ත නගරය.

8-544/1—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## බෙලිඅත්ත නගරය

### 1974 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

බෙලිඅත්ත නගරය පාලනය කරණ විශේෂ කොමසාරිස් විසින් 256 වෙනි අධිකාරිය වන සුළු නගර සභා ආඥා පනත යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලබන්නේ :

1. 256 වෙනි අධිකාරිය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛණයේ විස්තර වන ගණන අනුව 1974 වර්ෂයට රථවාහන හා සතුන් පිළිබඳ බද්දක් පනවා අය කිරීමට ද එම ගාස්තු 1973 වර්ෂයේ බල පැවැත්වූ ගාස්තු වලට සමාන බැවිද—

2. එකී ආඥාපනතේ 162 (3) වගන්තිය යටතේ එකී බදු 1974 මාර්තු මස 31 වැනිදාට හෝ එයට පෙර ගෙවිය හැකි අයුරින්ද වන බැව් වේ.

#### උපලේඛනය

| | රු. | ශ. |
|---|---|---|
| මෝටර් කාර්, මෝටර් රෝදත්‍රයේ කාර්, ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පා පැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන යම් ඕනෑම වාහනයක් සඳහා ... ... ... | 5 | 00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක්, හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් හෝ රෝදත්‍රයේ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක්— | | |
| (අ) වෙළඳාම සඳහා පාවිච්චි කෙරේ නම් ... | 5 | 00 |
| (ආ) වෙළඳාමට හැර වෙනත් කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1 | 00 |
| ගොන් දෙන්නා බැඳුනු සෑම බර කරත්තයක් හෝ තිරික්කලයක් සඳහා ... ... | 4 | 00 |
| තනි ගොනා බැඳුනු සෑම බර බාගයක් සඳහා ... | 2 | 50 |
| සෑම කරත්තයක් සඳහා ... ... | 2 | 00 |
| සෑම ජින් රික්ෂෝවක් සඳහා ... ... | 2 | 50 |
| සෑම අශ්වයෙක්, පෝනියෙක්, හෝ කොටළුවෙක් සඳහා | 5 | 00 |

එච්. ජී. ආනන්ද,
විශේෂ කොමසාරිස්,
බෙලිඅත්ත නගරය.

1973 ජූනි 31,
විශේෂ කොමසාරිස් කාර්යාලය,
බෙලිඅත්ත නගරය, බෙලිඅත්ත.

8-544/2—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## ඕතර පළාත දකුණ ගම්සභාව—හලාවත දිස්ත්‍රික්කය

### ගෝඝාතක ආඥාපනත

මෙහි පහත උපලේඛණයේ දක්වෙන අය විසින් 1973 වර්ෂයට මස් කඩයක් පවත්වා ගෙන යාම සඳහා බලපත්‍රයක් ඉල්ලුම් කර තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීම ගැන ඕතර පළාත දකුණ ගම්සභා සීමාව තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් එසේ විරුද්ධවීමට හේතු සඳහන් කර පිටපත් දෙකකින් යුත් ලියවිල්ලක්, මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවිය යුතු බවත්, ගෝඝාතක ආඥා පණතේ (272 අධිකාරය) 7 වැනි වගන්තිය යටතේ මෙයින් දනුම් දෙමි.

#### උපලේඛණය

| ඉල්ලුම්කරු | වෙළඳාම | වෙළඳාම් කරන ස්ථානය |
|---|---|---|
| අන්දරේගේ දොන් ඇලෝසියස් අප්පුහාමි ... | හරක් මස්, එළු මස්, ඌරු මස් ... | මෝරුක්කුලිය (ඕතර තඹරවිල) තෝප්පුව–දන්කොටුව පාරේ උණ පඳුර වත්තේ පිහිටි මස් කඩය |

ඩී. ජයසේකර,
සභාපති තැන
ඕතර පළාත දකුණ ගම්සභාව

ඕතර පළාත දකුණ ගම්සභා කාර්යාලය,
දූම්මලකොටුව—දන්කොටුව,
1973 ජූනි මස 08 වැනි දින,

8–532—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

## අහංගම ගෙවල් කුලී මණ්ඩලය

1972 අංක 7 දරණ ගෙවල් කුලී පණතේ කාර්යයන් උදෙසා, නිවාස හා ඉදිකිරීම් ඇමැති තුමා විසින් අංක 15,011/4 සහ 1972 මැයි මස 20 වැනි දින දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 1972 අංක 7 දරණ ගෙවල් කුලී පනතේ 43 වැනි වගන්තිය සහ 46 (2) (ඇ) වැනි වගන්තිය යටතේ සම්පාදිත නියෝගවල අංක 3 දරණ නියෝගය ප්‍රකාර, අහංගම ගෙවල් කුලී මණ්ඩලය වෙත එවිය යුතු සියලුම අයදුම්පත් එවිය යුතු ලිපිනයත්, එම අයදුම් පත් විභාග කිරීම සඳහා මණ්ඩලය රැස්වන ස්ථානයත් මෙහි පහත සඳහන් පරිදි බව මෙයින් නිවේදනය කරමි:—

ගෙවල් කුලී මණ්ඩලය,
සුළු නගර සභා කාර්යාලයය,
අහංගම.

පියදාස ගුණවර්ධන,
සභාපති,
අහංගම ගෙවල් කුලී මණ්ඩලය.

1973 ජූලි මස 25 දින,
අහංගම සුළු නගර සභා කාර්යාලයේදීය.

8-514—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

### කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඉබ්බාගමුව ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයෙහි නම් සඳහන් අය විසින් එහි සඳහන් ස්ථානයෙහි 1973 වර්ෂයට මස් පිණිස සතුන් මරා මස් විකිණීම පිණිස බලපත්‍රයක් ඉල්ලා අයදුම්පතක් මා වෙත ඉදිරිපත්කර තිබෙන බව මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ (272 වැනි අධිකාරය) (7) (2) වෙනි වගන්තිය යටතේ මෙයින් දනුම්දෙනු ලැබේ.

එම බලපත්‍රය නිකුත් කිරීම ගැන ඉබ්බාගමුව ගම්සභා ප්‍රදේශ සීමාවතුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නේ නම් ඔහු හෝ ඇය විරුද්ධ වන්නේ කුමන හේතුවක් නිසාද යන වග සඳහන් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දන්වීම ගැසට් පත්‍රයේ පළවූ දින සිට දින 21 ක් ඇතුළත මා වෙත එවියයුතු බව මෙයින් දනුම් දෙමි.

එච්. එම්. එච්. බණ්ඩා,
ඉබ්බාගමුව ගම්සභාවේ පාලන නිලධාරි සහ,
කුරුණෑගල සහකාර පළාත් පාලන කොමසාරිස්.

1973.07.23 දින,
ඉබ්බාගමුව ගම්සභා කාර්යාලයය,
ඉබ්බාගමුව.

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය | වෙළඳාම | ස්ථානය |
|---|---|---|
| එන්. එම්. අලීම්, මඩිගේ මුදුන්දූව, ඉබ්බාගමුව ... | ... එළහරක් මස් | ... මඩිගේ මුදුන්දූව–මාරගහමුල වත්ත |

8-370—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් 1972 ජනවාරි 7 දාතමින් (261 වන අධිකාරය වන) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වන වගන්තියේ ප්‍රකාර අංක, 15,001 දරන 1972 මාර්තු 10 දින ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV කොටසේ ප්‍රකාශයට පත් කරණ යට දැක්වෙන සංශෝධිත අතුරු ව්‍යවස්ථා පිළිගැනීමටත්, එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට වයඹ පළාතේ යගම්පත්තු ගම්සභා ප්‍රදේශය තුල ක්‍රියාත්මක කිරීමටත් ගම්සභා නියෝජිත ආර්. ඒ. අමරදාස හා හෙන්ද්‍රික් දිසානායක යන මහතුන්ගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

ඇස්. බී. ආර්. ජයරත්න,
යගම්පත්තු ගම්සභාවේ සභාපති.

1973 ජූලි මස 28 වැනි දින,
මාදම්පේ, ගම්සභා කාර්යාලයේදීය.

#### අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදිවූ 1953 අප්‍රේල් මස 10 වෙනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල IVIII වැනි කොටසෙහි අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාල අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩි දුරටත් සංශෝධනය කරනු ලැබේ:—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අලුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්—

"මෙම අතුරු ව්‍යවස්ථාවල අන්තරායදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථෝචිත I වන කොටසේ II වන කොටසේ III වන කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ" තවද

(2) 16 වැනි අතුරු ව්‍යවස්ථාවට ඉක්බිතිව පහත දැක්වෙන උපලේඛණය අන්තර්ගත කිරීමෙන් :—

#### උපලේඛනය

##### I වැනි කොටස—අන්තරායදායක ව්‍යාපාර

කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.

කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

පිදුරු ගබඩාවක් තබා ගැනීම.

අතින් ලී ඉරන ඉරුම්පොලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

යන්ත්‍රෝපකරණ පාවිච්චි කරන ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.

ඇව ගබඩාවක් පවත්වාගෙන යාම.

දර ගබඩාවක් පවත්වාගෙනයාම.

යන්ත්‍රොපකරණ පාවිච්චිකරණ කම්හලක් පවත්වානෙයාම.

තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුනු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අලුත් වැඩියා කිරීම.

පොල්කටු ගබඩාකර තබා ගැනීම.

මුද්‍රණාලයක් පවත්වාගෙනයාම.

ගැලුම් 50 කට වැඩි ප්‍රමාණයක් පොල්තෙල් ගබඩාකර තබා ගැනීම.

හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.

##### II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

කුකුලන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.

බැටලුවන්, එළුවන් හෝ ඌරන් 10 කට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙනයාම.

මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එසින් කළ භාණ්ඩ ගබඩාකර තබා ගැනීම.

පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

සත්ව ආහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.

සත්ව ආහාර ගබඩාවක් පවත්වාගෙන යාම.

පුන්නාක්කු ටොන් 1 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩා කර තබා ගැනීම.

සිමෙන්ති හොණ්ඩර 25 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

සුවඳ පුයර නිපදවීම.

කෙඳි සායම් කිරීම.

කරවල, ලුනු, මාලු හෝ ජාඩි හො. 3 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.

##### III වැනි කොටස—අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර

වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.

පොලිස් හෝ ඉටි වර්ග නිපදවීම.

රබර් කැවුන කෙඳි වර්ග නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පොළක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අලුත් වැඩියා කරන වැඩ පොළක් පවත්වාගෙන යාම.

මැටි බඳුන් ඔප දැමීම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අලුත් වැඩියා කිරීම සඳහා වැඩපොළක් පවත්වාගෙනයාම.

අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාලවූ 1945 දෙසැම්බර් මස 7 වෙනි දින අංක, 9,492 දරණ ගැසට් පත්‍රයේ සහ 1952 ඔක්තෝබර් මස 3 වැනි දින අංක 10,459 දරණ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරණලද යගම්පත්තු ගම්සභාවේ අතුරු ව්‍යවස්ථාවලට අමතරව වලංගු කරනු ලැබේ.

8-534—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

**පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත**

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද සංශෝධනයට දක්වන XVIII වැනි කාණ්ඩ පිළිගැනීමටත් එය ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවන දින සිට කළුකර ගම් ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, තිරණය කළ බැව් ප්‍රකාශ කරමි.

පී. බී. වර්සකෝන්,
පාලන නිලධාරි, කළුකර ගම් ප්‍රදේශය.

1973 ජූලි මස 25 වැනි දින,
රබල්කුඹුර,
පාලන නිලධාරි කාර්යාලයේ දී ය.

අතුරු ව්‍යවස්ථා

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර වලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"(1) මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහිවූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I වැනි කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ."

සහ,

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

උපලේඛනය

I වැනි කොටස—අන්තරායදායක ව්‍යාපාර

කබුක්, බොරළු හෝ කළුගල් කැඩීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩා කිරීම.
සිසිල් බීම නිෂ්පාදනය කිරීම.
ග්‍රෑස් එකකට වැඩි ප්‍රමාණයක සිසිල් බීම ගබඩාකර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිෂ්කර්ශණය.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක් පොල් තෙල් ගබඩා කර තබා ගැනීම.
පොල් තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක් ගැලුම් 12 කට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රෝස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනි පෙට්ටි ගබඩාකර තබා ගැනීම.
කුඹුල්, පුළුන් හෝ කපු පුළුන් ගබඩාකර තබා ගැනීම.
මෙතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
ගඩොල් හෝ උළු ගබඩාකර තබා ගැනීම.
ටින් පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග වලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
ඉඟුරු ගබඩාකර තබා ගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩාකර තබා ගැනීම.
කුලියට දීමට ලාම්පු ගබඩා කර තබා ගැනීම.
ධාන්‍ය හෝ මාෂ භෝග වර්ග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.
අතින් ලී ඉරන වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යාම.
ඇව ගබඩාවක් පවතවාගෙන යාම.
කිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
දර ගබඩාවක් පවත්වාගෙන යාම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යාම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුනු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
හිස් බෝතල් හෝ හිස් ගෝනි ගබඩාකර තබා ගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පොලක් පවත්වාගෙන යාම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
පොල් කටු ගබඩා කර තබා ගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ට්) සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ විවීම.
සිල්ක් සහ කෘතිම රෙදි විවීම හා විසිතුරු කිරීම.
අත් යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යාම.

II වැනි කොටස—අප්‍රසන්න ව්‍යාපාර

මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පොර හෝ රසායනික පොර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
හම් ගබඩාකර තබා ගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබා ගැනීම.
කුකුළන් 100 කට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යාම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වා ගෙන යාම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
පශු වෛද්‍ය ගිලන් හලක් පවත්වාගෙන යාම.
පුවක් සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
කරවල, ලුණු මාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අඟුරු සඳහා දැව හෝ පොල් කටු දැවීම හෝ අඟුරු ගබඩා කර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යාම.
පුන්නක්කු ටොන් 1කට වැඩි ප්‍රමාණයක් ගබඩා කර තබා ගැනීම.
සත්වාහාර හෝ කුකුල් කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සම් හෝ මස්ක්කොක්කා තැටි (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩා කිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යාම.
විරන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩාකර තබා ගැනීම.
ලෝහමය සුන් බුන් ද්‍රව්‍ය ගබඩාකර තබා ගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැල් වලින් භාණ්ඩ සෑදීම හෝ එසින් කළ භාණ්ඩ ගබඩකාර තබා ගැනීම.
වඩු කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබා ගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල් ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යාම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ෂණය කිරීම.
දත් බුරුසු හැර වෙනත් බුරුසු වර්ග නිෂ්පාදනය කිරීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

විනාකිරි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
ඇසිඩ් වගී නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
හුණුගල් හෝ හුණු ගබඩාකර තබා ගැනීම.
පැණි නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.

කොකෝවා හෝ වියලි පැපොල් කිරි ගබඩාකර තබා ගැනීම.
සම් භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්ත ශාලාවක් පවත්වාගෙන යාම.
පලතුරු, මාළු හෝ වෙනත් කෑම වගී ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වගී මාෂ බෝග, කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂ බෝග කෙටීම.
බේකින් පව්ඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලාකඩ නිපදවීම.
සුවඳ ද්‍රව්‍ය නිපදවීම.
පාසැල් රටහුණු නිපදවීම.

ටයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
ටයර් හෝ ටියුබ් වෝල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.

වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.

පාසැල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.

සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩා කර තබා ගැනීම.
සීත කළ මස් හෝ මාළු ගබඩා කර තබා ගැනීම.
කපාපු පොල් නිපදවීම.

ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යාම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ තිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

III වැනි කොටස—අන්තරායදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් ශුද්ධ කිරීම.
රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, එන්සාල් (කරදමුංගු) හෝ කෙඳි වගී සකස් කිරීම.
ඩ්‍රයි ක්ලීන් කරන ස්ථානයක් හෝ සායම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යාම.
විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යාම.
තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිලිස්සීම, සකස් කිරීම හෝ ගබඩා කිරීම හෝ හුණු ගල් කැඩීම.
බැටි බඳුන් ඔප දැමීම.
ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීම.
බැටරි චාර්ජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
වෑල්ඩින් සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීමේ වැඩපලක් පවත්වාගෙන යාම.
බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යාම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ භාණ්ඩ කුඩු කිරීම.
වාත්තු මඩුවක් පවත්වාගෙන යාම.
බෙලෙක් වැඩ පොලක් පවත්වාගෙන යාම.
ගල් ස්මාරක නිපදවීම.

පැට්රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යාම.
පැට්රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යාම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම.
පොලිෂ් ඉටි වර්ග නිපදවීම.
කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.

විෂබීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.
මදුරු කොයිල් (කොයිල්ස්) නිපදවීම.
ලී දඬු ආරක්ෂා ද්‍රව්‍ය නිපදවීම.
රබර් වක හෝ රබර් සිමෙන්ති නිපදවීම.
ගල් තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදනය කිරීම.
වීදුරු භාණ්ඩ නිපදවීම.
වීදුරු කැඩපත් නිපදවීම.
යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

පාස්සන ඊයම් නිපදවීම.
ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.
කටු කම්බි නිපදවීම.
කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.
බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.
ජී. අයි බාල්දි නිපදවීම.
වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධි ශීතකරණ (ඩීප් ප්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.
යන්ත්‍රෝපකරණ නිපදවීම.
රබර් කෑවුන් කෙඳි වර්ග නිපදවීම.
සංචායක බැටරි නිපදවීම.
වියලි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාර්ජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
වරක්ටර් රථ එකලස් කිරීම.
යම් යම් සුන් බුන් වලින් වටිනා ලෝහ නිස්සාරණය සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම.
රේඩියෝටර් පනිදවීම.

විදුලි කර්මාන්ත වැඩ පොලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන ස්ථානයක්, ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යාම.
විදුලි භාණ්ඩ නිපදවීම.

**7–367—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය**

---

## නෙළුව ගම්සභාව

**හැඳින්වීම.**—මෙම අතුරු ව්‍යවස්ථා නෙළුව ගම්සභාවේ මහජන පුස්තකාලය සඳහා වූ අතුරු ව්‍යවස්ථා නම් වේ.

1. නෙළුව ගම්සභාව මගින් පාලනය කරණු ලබන පුස්තකාලය පහත සඳහන් අංගයන්ගෙන් සමන්විත වේ:—

(අ) මහජන පුස්තකාලය

(ආ) කියවීම් ශාලාව.

2. 1. මෙම පුස්තකාලය හා කියවීම් ශාලාව පිළිබඳ සම්පූර්ණ වගකීම් හා පාලනය නෙළුව ගම්සභාවේ සභාපතිතුමා සතුවේ. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාර හා පාලනය කිරීම සම්බන්ධයෙන් ඕනෑට උපදෙස් ලබා ගැනීම සඳහා සුදුසු උපදේශක මණ්ඩලයක් පත් කර ගත හැකිය.

2. 2. පුස්තකාලය හා කියවීම් ශාලාව නිසියාකාර පැවැත්වීම හා පාලනය කිරීම ආදී කටයුතු සම්බන්ධයෙන් සම්පූර්ණ වගකීම ගම්සභාවේ පුස්තකාල භාරකරු වෙත පැවරේ.

3. පුස්තකාල සේවයේ ඕනෑම අංශයක් ඕනෑම කෙනෙකුට හෝ අනුමත කරන ලද ප්‍රජා මණ්ඩලයකට පාවිච්චි කිරීමට අවසර දීම හෝ නොදීම ගම්සභාවේ සභාපතිතුමා සතු බලයකි. තවද පාලන ව්‍යවස්ථා වන් උල්ලංඝනය කරන ඕනෑම කෙනෙකුට හෝ ප්‍රජා මණ්ඩලයකට මෙම අවසරය නොදී සිටීමට ගම්සභාවේ ප්‍රධානතුමාට බලය තිබේ.

4. 1. මහජන පුස්තකාලයේ සාමාජිකයෙක් වීමට පහත සඳහන් සුදුසුකම් තිබිය යුතුය:—

(අ) වයස අවු. 12 කට අඩු නොවීම.

(ආ) සාමාන්‍යයෙන් ලියන්නට කියන්නට ඇනගත් අයකුවීම.

(ඇ) ගම්සභා ප්‍රදේශය තුළ පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුල රක්ෂාවක යෙදී සිටිනා කෙනෙකුවීම.

(ඈ) පුස්තකාලය භාරකරු වෙත රු. 5 ක ඇප මුදලක් තැන්පත් කර තිබීම.

20. 2. යම් සාමාජික ප්‍රජා මංඩලයක් ඉල්ලා අස් වූ විට නැත් නම් 191 රීතිය යටතේ සාමාජිකත්වය අවලංගුවූ විට එම ප්‍රජා මංඩලයෙන් පුස්තකාලයට ලැබෙන්නට තිබෙන යම් මුදලක් වේ නම් එය එකී ප්‍රජා මංඩලය විසින් 4. 4. (ඇ) දරණ රීතිය යටතේ තැන්පත් කරණ ලද මුදලින් අඩු කරනු ලැබේ.

21. 1. අඟහරුවාදා හා බ්‍රහස්පතින්දා දිනයන් ද, රජයේ නිවාඩු දිනයන් හී හා සභාපතිතුමා විසින් නිම කරණු ලබන දිනයන් හීද, හැර අනිකුත් සෑම දිනයන් හිදීම පෙරවරු 8 සිට පස්වරු 5.30 දක්වා මහජන පුස්තකාලය විවෘතව තිබේ.

21. 2. පුස්තකාලය පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා 21 වැනි ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම ගම්සභාවේ සභාපතිතුමාට කලහැක. එමෙන්ම පුස්තකාලය වසා තබනු ලබන දිනයන් ද සාමාජිකයන්ගේ පහසුව උදෙසා වෙනස් කිරීමටද සභාපතිතුමාට පුළුවන. එසේ කල යුත්තේ සාමාජිකයන්ට ඒ බව ඉතා අඩුවශයෙන් දින 7 ක් කල් දීමෙන් පසුවය.

### කියවීම් ශාලාව

22. කියවීම් ශාලාව පාවිච්චි කරණ සෑම කෙනෙක්ම—

(1) ඒ සඳහා පුස්තකාලය භාරකරුගෙන් නිසි අවසරය ලබාගත යුතුය.

(2) කියවීම් ශාලාවේ තබා ඇති නාම ලේඛණයේ තමන්ගේ නම අත්සන් කල යුතුය.

23. පහත සඳහන් සුදුසුකම් ඇති ඕනෑම කෙනෙකුට කියවීම් ශාලා පාවිච්චි කිරීමට අවසරය දීමට පුස්තකාලය භාරකරුට පුළුවන :—

(1) වයස අවුරුදු 12 ට අඩු නොවීම.

(2) සමන්‍ය ලියවීමට කියවීමට දැන සිටීම.

(3) ගම්සභා ප්‍රදේශය තුල පදිංචිව සිටීම හෝ එම ප්‍රදේශය තුල රැකිරක්ෂාවක යෙදී සිටීම.

24. 1. අඟහරුවාදා හා බ්‍රහස්පතින්ද දිනයන් හි හා රජයේ නිවාඩු දිනයන් හි හැර අනිකුත් සෑම දිනයන් හිදීම පෙරවරු 10 සිට පස්වරු 5.30 දක්වා කියවීම් ශාලාව විවෘතව තිබේ.

24. 2. එහෙත් කියවීම් ශාලාව වසා තැබීම හෝ විවෘතව තැබීම සම්බන්ධයෙන් ගම්සභාවේ සභාපතිතුමාට මෙහි පහත සඳහන් බලතල තිබේ :—

(අ) කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ගේ පහසුව සඳහා ඉතා අඩුවශයෙන් දින 7 කට පලමු කරණ දැනුම්දීමකින් පසු 24 වන ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් වෙනස් කිරීම.

(ආ) ගම්සභාවේ සභාපතිතුමා අවශ්‍ය යැයි හැඟියන පරිදි විශේෂ හේතුන් නිසා කියවීම් ශාලාව වෙනත් දිනයන් හිදී හා වේලාවන් හිදී විවෘත කරවා තැබීම.

(ඇ) ඉතා අඩුවශයෙන් දින 6 කට පලමු කරන ලද දැනුම්දීමකින් පසු කියවීම් ශාලාවට අයත් බඩුබාහිරාදිය ගණන් ගැනීම සඳහා නියම කරණ ලද දිනයන් හිදී කියවීම් ශාලාව වසා තැබීම.

25. කියවීම් ශාලාවට අයත් කිසිම පොතක් පතක් සඟරාවක් සිතියමක් ලියවිල්ලක් හෝ වෙනත් කිසියම් දේපලක් කියවීම් ශාලාවෙන් පිටතට කිසිවෙකුට ගෙනයා නොහැක.

### සාමාන්‍ය

26. බෝවන රෝගයකින් පෙලෙන කිසිම කෙනෙකු රෝග පැතිර යාමේ කාලසීමාව ඉක්මවා යනතුරු මහජන පුස්තකාලයට හෝ කියවීම් ශාලාවට ඇතුළු නොවිය යුතුය.

27. 1. කියවීම් ශාලාව හා පුස්තකාලය තුල හෝ ඒ අසල නොමනා අන්දමින් හෝ අනුන්ට හිරිහැර වන අන්දමින් නොහැසිරිය යුතුය.

27. 2. පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ ඒ අවට ඇති ගම්සභාව සතුවූ ගොඩනැගිලි වලට හෝ වෙනත් දේපල වලට කිසිම අලාභ හානියක් නොකල යුතුය.

27. 3. කියවීම් ශාලාව හා පුස්තකාලය වසා ඇති වේලාවන් හිදී නිකරුනේ ඒ අසල නොහැසිරිය යුතුය.

27. 4. කියවීම් ශාලාව හා පුස්තකාලය තුල දුම්බීම හා කෙල ගැසීම නොකළ යුතුය.

27. 5. මහජන පුස්තකාලය තුලදී හෝ ඒ අසලදී කිසිවෙකු විසින් ආදුවලින් හෝ කඩදාසි වලින් සූදු කෙලීම හෝ මුදල් ඔට්ටු කිරීමෙන් කිසිම ක්‍රියාවක් කිරීම හෝ නොකල යුතුයි.

27. 6. පුස්තකාලය හා පුස්තකාලය ඇතුලත හෝ ඒ අසල කෑගැසීම් හෝ සිංදු කීම හෝ වෙනත් ශබ්ද ආදිය කිරීමෙන් පුස්තකාලය හා කියවීම් ශාලාව පාවිච්චි කරන්නන්ට බාධා නොකල යුතුයි.

27. 7. අපිරිසිදු ලෙස කියවීම් ශාලාවට හෝ පුස්තකාලයට ඇතුළු නොවිය යුතුය.

27. 8. බල්ලන් බලලුන් හෝ වෙනත් සතුන් පුස්තකාලය හා කියවීම් ශාලාව භූමියට නොගෙන ආ යුතුය.

27. 9. මහජන පුස්තකාලය හා කියවීම් ශාලාව තුල හෝ ඒ අසල නිදාගැනීම හෝ ආහාර ගැනීම නොකල යුතුය.

27. 10. පුස්තකාලය භාරකරු හෝ ඔහු විසින් ක්‍රියා කිරීමට බලය පවරනු ලද අයකු විසින් මේ අතුරු ව්‍යවස්ථා යටතේ නීත්‍යානුකූලව කරණු ලබන කටයුතු වලට කිසිවෙක් බාධා නොකල යුතුය.

28. මෙම අතුරු ව්‍යවස්ථාවල—ප්‍රධානතුමා හෝ සභාපතිතුමා යනුවෙන් නෙළුව ගම්සභාවේ සභාපතිතුමාද පුස්තකාලය භාරකරු වශයෙන් නෙළුව ගම්සභාව මගින් පත්කර ඇති පුස්තකාල සහායකද ගම්සභාව යනුවෙන් නෙළුව ගම්සභාවද ගම්ප්‍රදේශය හෝ ගම්සභා ප්‍රදේශය යනුවෙන් ගාළු දිස්ත්‍රික්කයේ නෙළුව ගම්සභා ප්‍රදේශයද සාමාජිකයෙකු යනුවෙන් 4. 1. රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ අයෙකු හෝ 4. 4. රීතිය යටතේ සාමාජිකත්වය ලැබූ ප්‍රජා මංඩලයක් ද අදහස් කරනු ලැබේ.

**පී. සමරනායක,**
**සභාපති,**
**නෙළුව ගම්සභාව.**

1973 ජූලි මස 29 දින,
නෙළුව ගම්සභා කාර්යාලයේ දීය.

8-384—73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු පිළිබඳ ගරු ඇමතිතුමා විසින් (261 වැනි අධිකාරය) පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තිය ප්‍රකාර, 1972 මාර්තු මස 10 වැනි දින අංක 15,001 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද පහත සඳහන් අතුරු ව්‍යවස්ථාව පිළිගැනීමටත්, එය ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ පළවන දින සිට රත්නපුර දිස්ත්‍රික්කයේ දොඩම්පෙ ගම්සභා ප්‍රදේශයේ ක්‍රියාත්මක කිරීමටත්, රත්නපුර දිස්ත්‍රික්කයේ දොඩම්පෙ ගම්සභාව 1973 ජනවාරි මස 31 වැනි දින පැවැත්වූ රැස්වීමේ අංක 9 (2) දරණ යෝජනාවෙන් තීරණය කළ බැව් මෙයින් ප්‍රකාශ කරමි.

ඇම්. ඒ. ගුණවර්ධන,
සභාපති,
දොඩම්පෙ ගම්සභාව.

1973 ජූලි මස
දොඩම්පෙ ගම්සභා කායාලයේ දී ය,
හොලිපිටිය,
කහන්ගම.

### අතුරු ව්‍යවස්ථාව

කලින් කල සංශෝධනය කරන ලද පරිදි වූ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයෙහි පළකරන ලද සම්මත අතුරු ව්‍යවස්ථාවල XVIII වැනි කොටසෙහි අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාරවලට අදාළ අතුරු ව්‍යවස්ථා පහත සඳහන් පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

(1) එහි 1 වැනි අතුරු ව්‍යවස්ථාව වෙනුවට පහත සඳහන් අළුත් අතුරු ව්‍යවස්ථාව ආදේශ කිරීමෙන් :—

"1. මෙම අතුරු ව්‍යවස්ථාවල "අන්තරාදායක හෝ අප්‍රසන්න ව්‍යාපාර" යන්නෙන් මෙහි වූ උපලේඛනයෙහි අවස්ථාවෝචිත පරිදි I කොටසේ, II වැනි කොටසේ හෝ III වැනි කොටසේ නිශ්චිතව සඳහන් යම් ව්‍යාපාරයක් අදහස් වේ.", තවද

(2) එම කොටසෙහි අවසානයට පහත දැක්වෙන උපලේඛනය අන්තර්ගත කිරීමෙන් :—

### උපලේඛනය

I වැනි කොටස

**අන්තරාදායක ව්‍යාපාර**

කබුක්, බොරළු හෝ කළුගල් කැනීම.
කබුක්, බොරළු හෝ කළුගල් ගබඩාකිරීම.
සිසිල් බීම නිෂ්පාදනය.
ග්‍රොස් 1 ට වැඩි ප්‍රමාණයක සිසිල් බීම බෝතල් ගබඩාකර තබා ගැනීම.
අයිස් නිපදවීම.
කොප්පරා නිෂ්පාදනය කිරීම, සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
යන්ත්‍රානුසාරයෙන් හෝ වෙනත් ක්‍රමයකින් එළවළු තෙල් නිස්කර්ෂණය.

ගැලුම් 50 ට වැඩි ප්‍රමාණයක පොල් තෙල් ගබඩාකර තබාගැනීම.
පොල්තෙල් හැර වෙනත් එළවළු තෙල් වර්ගයක ගැලුම් 12 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
ගිනිපෙට්ටි නිෂ්පාදනය.
ග්‍රොස් 10 ට වැඩි ප්‍රමාණයක ගිනිපෙට්ටි ගබඩාකර තබාගැනීම.
ඉඹුල් පුළුන් හෝ කපු හෝ කපුපුළුන් ගබඩාකර තබාගැනීම.
මැතිලේටඩ් ස්ප්‍රීතු නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබාගැනීම.
ගඩොල් හෝ උළු ගබඩාකර තබාගැනීම.
තේ පෙට්ටි හෝ ලෑලි පෙට්ටි නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ග නිපදවීම හෝ ගබඩකාර තබා ගැනීම.
කොහු හෝ වෙනත් කෙඳි වර්ගවලින් සාදන ලද භාණ්ඩ නිෂ්පාදනය කිරීම, හෝ ගබඩාකර තබාගැනීම.
පිදුරු ගබඩාකර තබාගැනීම.
පාවිච්චි කළ ඇඳුම් ගබඩකරා තබාගැනීම.
කුලියට දීම සඳහා ලාම්පු ගබඩාකර තබාගැනීම.
ධාන්‍ය හෝ මාෂ බෝග හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
ස්වර්ණාභරණ නිෂ්පාදනය කිරීම හෝ අළුත්වැඩියා කිරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන ලී ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
අතින් ලී ඉරණ ඉරුම් වලක් හෝ ඉරුම් මෝලක් පවත්වාගෙන යෑම.
දැව ගබඩාවක් පවත්වාගෙන යෑම.
දර ගබඩාවක් පවත්වාගෙන යෑම.
ගිරිගල් හෝ හුණුගල් සඳහා හෑරීම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි කෙරෙන කම්හලක් පවත්වාගෙන යෑම.
යන්ත්‍රෝපකරණ පාවිච්චි නොකෙරෙන කම්මලක් පවත්වාගෙන යෑම.
තොග වශයෙන් විකිණීම සඳහා පිටි, ලුණු හෝ සීනි හොණ්ඩර 15 ට වැඩි කිසියම් ප්‍රමාණයක් ගබඩාකර තබා ගැනීම.
ගිස් බෝතල් හෝ ගිස් ගෝනි ගබඩාකර තබාගැනීම.
බයිසිකල් හෝ මෝටර් සයිකල් අළුත්වැඩියා කිරීම සඳහා වැඩපලක් පවත්වාගෙන යෑම.
අළුත් හෝ පාවිච්චි කරන ලද රබර් ටයර් හෝ ටියුබ් 50 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
පොල්කටු ගබඩාකර තබාගැනීම.
ගෙන්දගම් හෝ ගෙන්දගම් කුඩු හොණ්ඩර 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
පාවිච්චි කරන ලද කඩදාසි හෝ පත්‍ර කඩදාසි හෝ ගබඩාකර තබා ගැනීම.
විසිරි පින්තාරු කිරීම (ස්ප්‍රේ පේන්ටින්) සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් නූල් කැටීම හෝ වියීම.
අත්යන්ත්‍ර ක්‍රමයෙන් හැර වෙනත් විධියකින් රෙදි නිපදවීම.
සිල්ක් සහ කෘත්‍රිම රෙදි වියීම හා විසිතුරු කිරීම.
මැසූ ඇඳුම් නිෂ්පාදනය.
මුද්‍රණාලයක් පවත්වාගෙන යෑම.

## II වැනි කොටස

## අප්‍රසන්න ව්‍යාපාර

මිණිරන් ශුද්ධකිරීම හෝ ගබඩාකර තබාගැනීම.
පෝර හෝ රසායන පෝර නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
හම් පදම් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
හම් ගබඩාකර තබාගැනීම.
උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ හොණ්ඩර 5 කට වැඩි ප්‍රමාණයක් උම්බලකඩ ගබඩාකර තබාගැනීම.
කුකුළන් 100 ට වැඩි ගණනක් සඳහා කුකුල් ගාලක් හෝ කුකුල් කොටුවක් පවත්වාගෙන යෑම.
බැටළුවන්, එළුවන් හෝ ඌරන් දහයකට වැඩි ගණනක් සඳහා මඩුවක් හෝ ගාලක් පවත්වාගෙන යෑම.
රබර් නිෂ්පාදනය කිරීම හෝ ගබඩාකර තබාගැනීම.
පශු වෛද්‍ය ගිලන්හලක් පවත්වාගෙන යෑම.
පුවක් සකස්කිරීම හෝ ගබඩාකර තබාගැනීම.
තොග වශයෙන් විකිණීම සඳහා නරක්වන සුළු කෑම වර්ග සහ ආහාර ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම.
කරවල, ලුණුමාළු හෝ ජාඩි හොණ්ඩර 3 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම, හෝ අයිස් දැමීම.
අඟුරු සඳහා දැව හෝ පොල්කටු දැවීම හෝ අඟුරු ගබඩාකර තබා ගැනීම.
සිමෙන්ති හොණ්ඩර 25 ට වැඩි ප්‍රමාණයක් ගබඩකාර තබාගැනීම.
අලවන ද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම.
දුම්කොළ සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.
සත්වාහාර ගබඩාවක් පවත්වාගෙන යෑම.
පුන්නක්කු ටොන් 1 ට වැඩි ප්‍රමාණයක් ගබඩාකර තබාගැනීම.
සත්වාහාර හෝ කුකුල්කෑම නිෂ්පාදනය කිරීම.
සතුන්ගේ මාංශාවශේෂ හෝ ලේ පැසවීම.
සබන් නිෂ්පාදනය කිරීම.
සව් හෝ මංඤාක්කා කැට් (ටැපියෝකා) නිපදවීම.
ඇටකටු ගබඩාකිරීම සඳහා අංගනයක් හෝ ගබඩාවක් හෝ පවත්වාගෙන යෑම.
ටිරන්ක් පෙට්ටි සෑදීම.
අළුත් ලෝහ හෝ පරණ ලෝහ ගබඩකර තබ ගැනීම.
ලෝහමය සුන්බුන් ද්‍රව්‍ය ගබඩාකර තබාගැනීම.
ගෘහ භාණ්ඩ නිපදවීම හෝ ගබඩාකර තබා ගැනීම.
මෙරට හෝ රට වේවැලින් භාණ්ඩ සෑදීම හෝ එයින් කළ භාණ්ඩ ගබඩාකර තබාගැනීම.
වඩු කර්මාන්තශාලාවක් පවත්වාගෙන යෑම.
කොන්ක්‍රීට් හෝ මැටි පයිප්ප ගබඩාකර තබාගැනීම.
සිරප් හෝ පළතුරු බීම වර්ග සෑදීම.
රස කැවිලි වර්ග නිපදවීම.
පොල්ලෙලි හෝ දැව පල් කිරීම සඳහා කොටුවක් පවත්වාගෙන යෑම.
මේද නිපදවීම හෝ නිෂ්කර්ශනය කිරීම.
දත් බුරුසු වර්ග හැර වෙනත් බුරුසු වර්ග නිපදවීම.
දත් බුරුසු නිපදවීම.
රා එකතු කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.
වීනාකිරි නිපදවීම හෝ ගබඩකාර තබාගැනීම.
ඇසිඩ් වර්ග නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.
හුණුගල් හෝ හුණු ගබඩාකර තබාගැනීම.
පෑනි නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.
පින්තාරු තීන්ත, වාර්නිෂ් හෝ ඩිස්ටැම්පර් සායම් හෝ ඒවා හොණ්ඩර 5 ට වැඩි ප්‍රමාණයකින් ගබඩාකර තබාගැනීම.
ලෑලි සකස් කිරීම හෝ ලෑලි පදම් කිරීම.
සෝඩා නිපදවීම.
කෙඳි සායම් කිරීම.
කොකෝවා හෝ වියළි පැපොල් කිරි ගබඩාකර තබාගැනීම.
සම්භාණ්ඩ නිෂ්පාදනය සඳහා කර්මාන්තශාලාවක් පවත්වාගෙන යෑම.
පළතුරු, මාළු හෝ වෙනත් කෑම වර්ග ටින්වල ඇසිරීම.
කෝපි, ධාන්‍ය වර්ග, මාෂභෝග කුළුබඩු හෝ පිටි ඇඹරීම.
යන්ත්‍රානුසාරයෙන් ධාන්‍ය හෝ මාෂභෝග කෙටීම.
බේකිං පවුඩර් නිපදවීම.
මාජරින් නිපදවීම.
ගෑස් මැන්ටල් නිපදවීම.
පොට් නිපදවීම.
ඉටිපන්දම් නිපදවීම.
කපුරු නිපදවීම.
ලියන තීන්ත, අච්චු තීන්ත හෝ ස්ටෙන්සිල් තීන්ත නිපදවීම.
රෙදි සෝදන නිල් නිපදවීම.
සායම් කුඩු නිපදවීම.
ලා කඩ නිපදවීම.
සුවඳ පුයර නිපදවීම.
පාසල් රටහුණු නිපදවීම.
වයර් කට්ටා කැපීම හෝ පිරවීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
ටයර් හෝ ටියුබ් වල්කනයිස් කිරීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.
සිමෙන්ති භාණ්ඩ හෝ ඇස්බැස්ටෝස් සිමෙන්ති භාණ්ඩ නිපදවීම.
වැලි කඩදාසි නිපදවීම.
ගල් නිපදවීම, ඇඹරීම හෝ ඔප දැමීම.
පාසල් ගල්ලෑලි නිපදවීම.
සෞඛ්‍ය තුවාකඩ නිපදවීම.
ප්ලාස්ටික් භාණ්ඩ නිපදවීම.
සෙල්ලම් බඩු නිපදවීම.
මුහුදු පාසි සකස් කිරීම හා ගබඩාකර තැබීම.
සීත කළ මස් හෝ මාළු ගබඩාකර තැබීම.
කපාපු පොල් නිපදවීම.
ඡායාරූප ශාලාවක් පවත්වාගෙන යෑම.
මැණික් ගල් කැපීම හා ඔප දැමීම.
දිය හුණු, සුදු (වයිටිං) හුණු හෝ හිරිගල් නිපදවීම.
එන්සාල් (කරදමුංගු) සකස් කිරීම හෝ වේලීම.

## III වැනි කොටස

### අන්තරාදායක හා අප්‍රසන්න ව්‍යාපාර

තලාතු මිණිරන් ශුද්ධ කිරීම.

රසායන ද්‍රව්‍ය පාවිච්චි කොට කුරුඳු, (කරඳමුංගු) එන්සාල් හෝ කෙඳි වර්ග සකස් කිරීම.

ඩ්‍රයි ක්ලීනිං කරන හෝ සායම් දමන ස්ථානයක් පවත්වාගෙන යෑම.

රෙදි මුද්‍රණය කරන හෝ සායම් දමන ආයතනයක් පවත්වාගෙන යෑම.

විද්‍යුත් ලෝහාලේපනය කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

තෙල් හෝ සත්ව මේද පැසවීම.

හුණු පිළිස්සීම, සකස් කිරීම, ගබඩා කිරීම හෝ හුණුගල් කැඩීම.

මැටි බඳුන් ඔප දැමීම.

ගිනි කෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝර වරල් සකස් කිරීම හෝ ගබඩාකර තබා ගැනීම.

හොණ්ඩර 3 ට වැඩියෙන් තේ ගබඩාකර තබා ගැනීම.

බැටරි චාජ් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

වැල්ඩිං සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම සඳහා වැඩ පලක් පවත්වාගෙන යෑම.

බෝට්ටු තැනීම සඳහා ආයතනයක් පවත්වාගෙන යෑම.

යන්ත්‍රානුසාරයෙන් ලෝහ කුඩු කිරීම.

වාත්තු මඩුවක් පවත්වාගෙන යෑම.

බෙලෙක් වැඩපලක් පවත්වාගෙන යෑම.

ගල් ස්මාරක නිපදවීම.

පැට්‍රෝල්, ඩීසල් තෙල් හෝ වෙනත් යම් ඛනිජ තෙල් වර්ගයක් ගබඩාකොට ඇති ස්ථානයක් පවත්වාගෙන යෑම.

පැට්‍රෝල් නිකුත් කරන ස්ථානයක් පවත්වාගෙන යෑම.

මෝටර් වාහන සඳහා බොඩි නිපදවීමේ ආයතනයක් පවත්වාගෙන යෑම.

පොලිෂ් හෝ ඉටි වර්ග නිපදවීම.

කෘෂි රසායන ද්‍රව්‍ය නිපදවීම හෝ ගබඩාකර තබාගැනීම.

විෂ බීජ නාශක ද්‍රව්‍ය නිපදවීම.

මදුරු කව (කොයිල්ස්) නිපදවීම.

ලී දඹු ආරක්ෂක ද්‍රව්‍ය නිපදවීම.

රබර් ද්‍රාවක හෝ රබර් සිමෙන්ති නිපදවීම.

ගල්තාර හෝ වෙනත් බිටුමන්මය නිෂ්පාදන නිපදවීම.

වීදුරු භාණ්ඩ නිපදවීම.

වීදුරු කැබලිති නිපදවීම.

යකඩ තහඩු ගැල්වනයිස් කිරීම.

ප්ලාස්ටික් රෙසින් නිපදවීම.

ඇලුමිනියම් භාණ්ඩ නිපදවීම.

කටු කම්බි නිපදවීම.

කම්බි ඇණ නිපදවීම.

කාබන් කඩදාසි හෝ යතුරු ලියන පටි (රිබන්) නිපදවීම.

බෙලෙක් බඳුන්, වානේ පීප්ප හෝ ගබඩා ටැංකි නිපදවීම.

ජී. අයි. බාල්දි නිපදවීම.

වායු සමන යන්ත්‍ර, ශීතකරණ හෝ අධිශීතකරණ (ඩීප් ෆ්‍රීසර්) නිපදවීම, සර්විස් කිරීම හෝ අළුත්වැඩියා කිරීම.

බ්‍රේක් ලයිනිං හෝ ක්ලච් ලයිනිං නිපදවීම.

යන්ත්‍රෝපකරණ නිපදවීම.

විදුලි භාණ්ඩ නිපදවීම.

රබර් කැවුන කෙඳි වර්ග නිපදවීම.

සංචායක බැටරි නිපදවීම.

වියළි කෝෂ බැටරි නිපදවීම.

ඊයම් බැටරි නැවත චාජ් කිරීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

රන්කම් සුන්බුන්වලින් වටිනා ලෝහ නිෂ්කර්ෂනය සඳහා ස්ථානයක් පවත්වාගෙන යෑම.

ට්‍රැක්ටර් රථ එකලස් කිරීම.

රේඩියේටර් නිපදවීම.

විදුලි කර්මාන්ත වැඩ පලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර අළුත්වැඩියා කරන වැඩපලක් හෝ ගුවන් විදුලි යන්ත්‍ර නිපදවන වැඩ පලක් පවත්වාගෙන යෑම.

### නිවැරදි කිරීමයි

1971 ඔක්තෝබර් මස 15 වැනි දින අංක 14,980 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ (IV වැනි කොටසේ) 820 වැනි පිටුවේ දොඩම්පෙ ගම්සභාවේ සභාපති විසින් පළ කරන ලද යෝජනාවේ දෙවැනි ඡේදයේ සඳහන් "XXVIII" යන්න "XXXVIII" යනුවෙන් නිවැරදි විය යුතුය.

ඇම්. ඒ. ගුණවර්ධන,
දොඩම්පෙ ගම්සභාවේ සභාපති.

1973 ජූලි මස 28 වැනි දින,
දොඩම්පෙ ගම්සභාව කාර්යාලයේ දීය.
හොලීපිටිය, කහන්ගම.

8-447 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

---

### 1952 අංක 6 දරණ පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනත (261 වැනි පරිච්ඡේදය)

පළාත් පාලන ආයතන (පොදු අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදයේ) 3 වැනි වගන්තිය යටතේ කොළඹ දිස්ත්‍රික්කයේ දොම්පෙ-මාපිටිගම ගම් සභාව විසින් සම්මත කරගෙන තිබෙන පහත සඳහන් යෝජනාව එකී වගන්තියේ ප්‍රකාර මෙයින් පළ කරනු ලැබේ.

### යෝජනාව

පළාත් පාලන අමාත්‍යතුමා විසින් සම්පාදනය කරනු ලැබ 1953 අප්‍රේල් මස 10 වැනි දින අංක 10,517 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ සහ නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1953 අගෝස්තු මස 7 වැනි දින අංක 10,560 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දා වූ ද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල 1 සිට xxxvii දක්වා වූ කාණ්ඩද, 1963 ජූනි මස 21 දින අංක 13,679 දරණ ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලයේ හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව, 1965 ජනවාරි මස 8 වැනි දින අංක 14,287 දරණ ගැසට් පත්‍රයේ පළවූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල xxxviii වැනි කාණ්ඩය හා 1966 ජූලි මස 8 වැනි දින අංක 14,703 දරණ ගැසට් පත්‍රයේ පළකරන ලද්ද වූ ද, උත්තර මන්ත්‍රී මණ්ඩලය හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ යෝජනාවකින් අනුමත කරන ලද බව 1969 ජනවාරි මස 3 වැනි දින අංක 14,835 දරණ ගැසට් පත්‍රයේ පළ වූ නිවේදනයෙන් ප්‍රකාශ කරන ලද්දාවූද, පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථාවල xxxix සිට xxxxi දක්වා වූ කාණ්ඩද, XL හා XLI කාණ්ඩද මේ යෝජනාව ගැසට් පත්‍රයේ පළ වන දිනයේ සිට සම්මත කර ගැනීමට කොළඹ දිස්ත්‍රික්කයේ දොම්පෙ-මාපිටිගම ගම් සභාව විසින් පළාත් පාලන ආයතන (පොදු ආදර්ශ අතුරු ව්‍යවස්ථා) පනතේ (261 වැනි පරිච්ඡේදයේ) 3 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් යෝජනා කර සිටිනු ලැබේ.

කේ. ඩී. චන්ද්‍රපාල,
දොම්පෙ-මාපිටිගම ගම්සභාවේ සභාපති.

ගම්සභා කාර්යාලය,
දොම්පෙ,
1973.07.27 වැනි දින.

8-550 —73.08.10 දින අංක 72 දරණ ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළකරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊලඟ ගැසට් පත්‍රයේ එය පළකළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් ඊළඟ ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාක් හැර එය සියළුදෙනාගේ පහසුවටද හේතු වන බව සලකන්න.

ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියළුම දායක මුදල් **කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

**සැ.යු.**—මුදල් ගෙවා ගැසට් පතෙහි පළකරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශනාංශයේ අධිකාරී වෙත නොව **ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති** වෙත එවිය යුතු බව සලකන්න.

### උපලේඛනය

**1973**

| මාසය | පළකිරීමේ දිනය | | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|---|
| අගෝස්තු | 73.08.03 | සිකුරාද | ... 73.07.27 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.10 | සිකුරාද | ... 73.08.03 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.17 | සිකුරාද | ... 73.08.10 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.24 | සිකුරාද | ... 73.08.17 | සිකුරාද | දවල් 12.00 |
| | 73.08.31 | සිකුරාද | ... 73.08.24 | සිකුරාද | දවල් 12.00 |
| සැප්තැම්බර් | 73.09.07 | සිකුරාද | ... 73.08.31 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.14 | සිකුරාද | ... 73.09.07 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.21 | සිකුරාද | ... 73.09.14 | සිකුරාද | දවල් 12.00 |
| | 73.09.28 | සිකුරාද | ... 73.09.21 | සිකුරාද | දවල් 12.00 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්.
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1973 මැයි මස 04 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව, කොළඹ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි